## මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අරමුදල - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පර්වයේ පිළිගත් ගිණුම්කරණ ආකෘතිමය රාමුවට අනුව පිළියෙල කර නොතිබුණි.

### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

අරමුදලට අමාත්‍යාංශයෙන් ලද මෝටර් රථයේ වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

### 1.2.2 ලැබිය යුතු ගිණුම්

2008 වර්ෂයේ සිට පැවත එන රු. 127,343 ක අත්තිකාරම් මුදල 2013 අගෝස්තු 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු. 139,270,616 ක් වූ දේපල, පිරියත, උපකරණ හා වාහන සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය , විස්තරාත්මක උපලේඛනය, වත්කම් පිළිබඳ සමීක්ෂණ වාර්තා ආදිය ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට /සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.2.4 නීති , රීති, රෙගුලාසි වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති , රීති , රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති , රීති , රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| **(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| (i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 චක්‍රලේඛයේ | |
| 2:11 උප වගන්තිය | අරමුදල සතු වාහනවල දැවෙන ඉන්ධන ප්‍රමාණය සෑම මාස 06 කටම වරක් පරීක්ෂා කළ යුතු වුවද , එසේ සිදු කර ලේඛණගත කර නොතිබුණි. |
| (ii) 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 චක්‍රලේඛය | චක්‍රලේඛය පරිදි වැඩ බලන කාලය මාස 3 ක උපරිමයකට යටත් විය යුතු වුවත්, 2009 මැයි 05 දින හිටපු අධ්‍යක්ෂකවරයා විශ්‍රාමයාමෙන් පසු 2013 අගෝස්තු 31 වන තුරුත් එම ධූරය පුරප්පාඩුව පැවතුන. |
| **(ආ)** 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පී/එෆ/ 437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අරමුදලට ආදාල වන පරිදි නියමිත රක්ෂණ ආවරණයන් ලබා ගත යුතු වුවත් එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. |
| **(ඇ)** 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුල අරමුදලේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු. 82,999,417 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු. 74,972,312 විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සසඳන කළ මූල්‍ය ප්‍රතිඵලයන්හි රු. 8,027,105 ක වැඩිවීමක් විය. ආයෝජන සඳහා පොලී ලැබීම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 8,613,328 කින් එනම් සියයට 667 කින් වැඩිවීම මීට බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ 20 (i) (අ) හා 37 වගන්ති පරිදි වෙළඳාමේදී භාවිතාවන සෑම මිනුම් උපකරණයක්ම වාර්ෂිකව සත්‍යාක්ෂණය කළ යුතු වුවද, එසේ සෑම උපකරණයක්ම සත්‍යාක්ෂණය කරන බව තහවුරු කර ගැනීමේ නිසි ක්‍රමවේදයක් අරමුදල සතුව නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් නිලධාරීන් විසින් සත්‍යාක්ෂණය කරනු ලබන ඒකක හා ඊට අදාලව අය කරනු ලබන ගාස්තු පිළිබඳ විස්තර එම නිලධාරීන් විසින් අරමුදලට වාර්තා කරනු ලැබුවද , ඒවායේ නිවැරදිතාවය තහවුරු කෙරෙන නිසි ක්‍රමවේදයන් අරමුදල සතුව නොතිබුණි. එහෙයින් එකී මිනුම් ඒකක මුද්‍රා තැබීමෙන් ලද ආදායමේ නිවැරදිතාවය පිළිබඳ විගණනයට සෑහීමකට පත්විය නොහැකි විනි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නව විද්‍යාගාරයක් හා ප්‍රධාන කාර්යාලය වෙනම ස්ථානයක ඉදිකිරීම සඳහා 2009 දෙසැම්බර් 09 දින ඉදිරිපත් කෙරුණු අංක 09/2671/342/019 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද, 2012 දෙසැම්බර් 31 වන විටත් කොන්ත්‍රාත්කරුවකු තෝරා

ගැනීමේ කාර්යය අවසන් කර නොතිබුණි. 2013 අගෝස්තු වන විට මෙහි වැඩ කටයුතු සිදුකෙරෙමින් පවතින බව අධ්‍යක්ෂවරයා විගණනයට දන්වා තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල අතර රු.මිලියන 5 ක ඇස්තමේන්තුවක් මත පරිගණක ජාලයක් ස්ථාපිත කිරීමට 2011 වර්ෂයේදී සැළසුම් කර තිබුණද, 2012 දෙසැම්බර් 31 වන විටත් දිස්ත්‍රික් කාර්යාල 13ක් සඳහා පමණක් පරිගණක බෙදා හැරීමක් සිදු කර තිබුණි. එහෙයින් පරිගණකජාල ගත කිරීමෙන් අපේක්ෂා කළ අරමුණු ඉටුවී නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැළැස්ම

අරමුදල විසින් සංයුක්ත සැළැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.2 ක්‍රියාකාර සැළැස්ම

සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණද සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාර සැළැස්මක් සකස්කර තිබුණි. නමුත් එය වාර්ෂික අයවැයට සමගාමීව සකස් වී නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

අරමුදලේ අභ්‍යන්තර විගණනය සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයට අයත් අභ්‍යන්තර විගණන ඒකකය මගින් සිදුකර තිබුණුද, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රමාණවත් විගණනයක් සිදු කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

### 4.4 අයවැය ලේඛනමය පාලනය

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සංයක්ත සැළැස්මට හා වාර්ෂික ක්‍රියාකාර සැළැස්මට අනුකූලව ඊට තාත්වික වන අන්දමින් අයවැය ලේඛනය සකස්කර ඇති බව නිරීක්ෂණය නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂයේ පහත වැය විෂයයන්ගේ ප්‍රතිශෝධිත ඇස්තමේන්තු අවසාන ප්‍රතිශෝධනයේදී වැඩි කර තිබුණද , වියදම දෙස බැලීමේදී නිසි සැළැස්මකින් තොරව ඒවා වැඩිකර ඇති බව නිරීක්ෂණය විය.

| වැය විෂයය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.) | අවසාන ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.) | තථ්‍ය වියදම (රු.) | ඉතිරියේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| 1303 - ඉඩම් සහ ගොඩනැගිලි අළුත්වැඩියා | 500,000 | 650,000 | 196,324 | 70 |
| 1401 - ප්‍රවාහන | 20,000 | 1,500,000 | 3,593 | 99 |
| 2001 - ගොඩනැගිලි අළුත්වැඩියා | 6,000,000 | 6,950,000 | 3,220,607 | 54 |
| 2104 - ගොඩනැගිලි ඉදිකිරීම් | 341,000,000 | 335,000,000 | 17,303,553 | 95 |

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ගමන් වියදම් හා අතිකාල වියදම්

(ඇ) අභ්‍යන්තර විගණනය

(ඈ) වාහන හා ඉන්ධන භාවිතය